**13 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව - 5 වන සතිය - ජූනි 1 සිට 5 දක්වා**

## ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය හා එහි වෙනස්කම්

| කාණ්ඩය | 1977 | 2017 | 2018 |
|---|---|---|---|
| කෘෂිකාර්මික අපනයනය | 79% | 24.4% | 21.7% |
| කාර්මික අපනයනය | 14% | 75.2% | 77.9% |
| ඛනිජමය අපනයනය | 5% | 0.3% | 0.3% |
| වර්ග නොකළ අපනයනය | 2% | 0.1% | 0.1% |

## ශ්‍රී ලංකාවේ ආනයනය ව්‍යුහය හා එහි වෙනස්වීම්

| කාණ්ඩය | 1977 | 2017 | 2018 |
|---|---|---|---|
| පාරිභෝගික භාණ්ඩ | 42% | 21.5% | 22.4% |
| අන්තර් භාණ්ඩ | 48% | 54.5% | 56.2% |
| ආයෝජන භාණ්ඩ | 12% | 23.3% | 21.1% |
| වර්ග නොකළ ආනයන | 1% | 0.7% | 0.3% |

**ශ්‍රී ලංකාව අපනයන වෙළඳාමේ දී මුහුණ දෙන ගැටලු**

1.අපනයන බෝගවල මිල උච්චාවචනය වීම
2.අපනයන පරිමාව අඩුවීම
3.ලෝක වෙළෙඳපොලේ දැඩි අවිනිශ්චිතතාවය
4.ගෝලීය ආර්ථික අවපාතනය
5. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ වල වර්ධනය මන්දගාමී වීම

•පහත සදහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
1.අපනයන වෙළෙඳාම හා ආනයනය වෙළෙඳාම අතර වෙනස දක්වන්න
2. ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය හා ආනයන ව්‍යුහය වෙන් වෙන්ව දක්වන්න
3.1977ට පසුව ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහයෙහි හා ආනයන ව්‍යුහයෙහි හටගෙන ඇති වෙනස්කම් පරීක්ෂා කරන්න
4. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන හා ආනයන අයිතම හතර බැගින් දක්වන්න
5. ශ්‍රී ලංකාව අපනයන වෙළඳාමේදී මුහුණ දෙන අභියෝග කවරේද?